



**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත





## පුරවැසි බලය

රටක පුරවැසියන් සතු ශක්තිය කෙතරම්දැයි නැවත වතාවක් තහවුරු වී තිබේ. එකමුතු වූ පුරවැසි බලය අබිබවා යා හැකි වෙනත් බලවේගයක් තිබිය නොහැකිය යන්න අවිවාදිතය. ජනතා සිත් දූෂණය කරමින් ඉදිරියට ගෙන ආ වියරු ජාතිවාදයත් දූෂණයත් ජනතාව විසින් ප්‍රතික්ෂෙප කරනු ලැබ ඇත්තේ ය. මෙය යහපත් ප්‍රවණතාවකි. එකම පක්ෂයක් දීර්ඝකාලීනව බලය අල්ලාගෙන සිටීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට පටහැණි ය. එකම පක්ෂයක් විවිධ උපක්‍රම යොදා ගනිමින් දීර්ඝකාලීනව බලයේ රැඳී සිටීම දූෂණයට මග පාදයි. එවන් පරිසරයක් තුළ පාලකයන් බලයෙන් මත්වීම නොවැළැක්විය හැකිය. රටක බලය විවිධ පක්ෂ අතට මාරු වී යා යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්නේ එවිටය.

කුමන දේ'ශපාලන පක්ෂය සැළකුවද ශ්‍රී ලංකාවේ බහුතරයක් දේශපාලනඥයෝ දූෂිතයෝ ය. අවාසනාවට ඡන්ද දායකයකයන් නැවත නැවත ඡන්දයෙ දන්නේද මේ දූෂිතයන්ටමය. තමන්ගේ දේශපාලන පක්ෂයේ ඉන්නා දූෂිතයන් නොවන අයට ඡන්දය දෙන්නැයි කොපමණ ඉල්ලීම් කළ ද මේ අපූරු ධන්වදායකෙයන්ගේ කතිරය වැටෙනන්නේම දූෂිතයන් ඉදිරියේ වීම තේරුම් ගත නොහැකි තරමු පුදුම තත්වයකි. මෙයින් පෙනී යන්නේ ජනතාව නිසි ලෙස දැනුම්වත්වී නැතිය යන්නය. ජනතාව දැනුම්වත් කිරීම සඳහා බුද්ධිමත් පුරවැසියන් සතු වගකීම විශාලය. සක්‍රීය පුරවැසි බලවේගයක අවශ්‍යතාව වඩාත් දැනෙන්නේ මේවන් පරිසරයකය.

පුරවැසියා ජද්ශපාලකයා වන්දනාමාන කරනවා වෙනුවට දේශපාලකයාට වඩා ඉදිරියෙන් සිට දේශපාලකයා මෙයෙහෙවිය යුතු ය. වන්දනාමාන කළ යුතු වන්නේ දේශපාලකයන් නොව ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළ ය. බලය හමුවේ දේශපාලකයෝ ඇස් අන්ධ කර ගනිති. ඔවුනට නිසි මග මේ යයි පෙන්වා දිය හැකි වන්නේ පුරවැසි බලය ශක්තිමත් නම් පමණකි. පුරවැසියන් පෙන්වා දෙන යහ මග ඔස්සේ නොයන දේශපාලකයන් ඉවත් කිරීමේ පින්කම ඉටුකිරීම පුරවැසියාගේ ඊළඟ යුතුකම වෙයි.

අපේ රට යමින් තිබෙන්නේ නිසි මාර්ගලයේ නොවේ. රට යමින් තිබුණේ අන්ත දූෂිත මජර ක්‍රමයක ටය. දැන් වත් අවදි වී මේ තත්වය සමහන් කරගැනීමේ ක්‍රියාදාමයට එළැඹිය යඅතුය ඒ සඳහා පාලකයන් මෙහෙයවිය යුතුය. ඒ මෙහෙයවීම සඳහා ශක්තිමත් පුරවැසි බලයක් ගොඩ නැගීම අද දවසේ වැදගත්ම අවශ්‍යාව වන්නේ ය.



# පරාජිත අපතයන් පස්සදෙරෙන් ගැනීම ජනමතය කෙළෙසීමක්

**ජයතිලක කම්මැල්ලවීර**
kammalweera@gmail.com



පුරුදු අතහරින්නට නොහැකි කීප දෙනෙකු මැතිවරණ නීති නොසලකා මනාප එකතු කර ගන්නට මජර වැඩ කළ නමුත් මෙවර පැවැත්වුණෝ මෙරට පැවැත්වුණු මහමැතිවරණ අතරින් වඩාම නිදහස් හා සාධාරණ මැතිවරණය යයි පිළිගැනීමක් ඇත. ඒ අනුව ඡන්දදායකයා නිදහසේ තම කැමැත්ත ප්‍රකාශ කළේ යයි ද ප්‍රතිඵලය පිරිසිදු මහජන කැමැත්ත යයි ද කිව හැකිය. එසේ වුවද ජාතිවාදී ප්‍රචාරයන්ට සහ බොරු පොරොන්දුවලටද සැලකිය යුතු ඡන්ද දයක පිරිසක් රැවටුණු බවත් ඒ අනුව ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ වූයේ රටේ යහපත වෙනුවෙන් නොවන බවත් පිළිගත යුතු වෙයි. ඒ අයහපත් තත්වය වෙනස් කර ගත යුතුව ඇත. එය රට හමුවේ ඇති බරපතල අභියෝගයකි. එය පැහැදිලි දේශපාලන ප්‍රතිපත්තියක පිහිටා දියත් කෙරෙන තීරණාත්මක වැඩපිළිවෙලක් මගින් ජයගන්නවා මිස උපායෙන් උප්පර වැට්ටිවලින් කළ හැක්කක් නොවේ.

19වැනි සංශෝධනය අනුමත කරවා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු කීප දෙනෙකුට ඇමතිකම් ලබා දුන් නමුත් ඇමති තතුරුවල හිඳිමින් ඔවුන් කළේ ජනාධිපති මෛත්‍රීගේ ප්‍රකාශිත ප්‍රතිපත්තිවලට විරුද්ධව කෑ කෝ ගැසීමයි. මහින්ද රාජපක්ෂ වෙනුවෙන් තප්පුලෑමයි. විශේෂයෙන් ඒ දිනවල ඩිලාන් පෙරේරාගේ හැසිරීම බෙහෙවින් අප්‍රසන්න විය. දැන් ජාතික ලැයිස්තුවෙන් ඔහු ඇතුළු පරාජිතයන් කීප දෙනෙකුටම මෛත්‍රීගේ මෛත්‍රියෙන් මන්ත්‍රීකම් ලැබී තිබේ. කෙසේ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කොටසක් ආණ්ඩුවට සම්බන්ධ කර ගැනීම සඳහා මෙසේ පරාජිතයන්ට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීකම් පිරිනැමීම නිදහස් හා සාධාරණ මැතිවරණයකදී ඡන්ද දයකයා දුන් තීන්දුවට පටහැනි ක්‍රියාවකි. ජනාධිපතිවරයා විසින් කරන ලද්දේ වුවත් හොඳ අපේක්ෂාවකින් කරන ලද්දේ වුවත් එය ජනමතය කෙලෙසීමකි. මෛත්‍රීගේ කැමැත්තට පිටින් මහින්දවාදීන් විසින් සකස්කර තිබුණු ජාතික ලැයිස්තුවේ ජී. ඇල් පීරිස්, ඩිව් ගුණසේකර, තිස්ස විතාරණ, සහ ඩිලාන් පෙරේරා වැනි දේශපාලන අපතයන් සිටි බව ඇත්තය. ඒ අනුව එම අපතයන්ට දෙර වැසීම සඳහා ජාතික ලැයිස්තුව වෙනස් කිරීම සාධාරණ නමුත් මහමැතිවරණයේදී ඡන්දදයකයා විසින් ප්‍රතික්ෂේප කළ අය පාර්ලිමේන්තුවට ගෙන ඒම කිසිසේත් සාධාරණ නොවේ.

තවද මේ කවුරුත් පසුගිය දස වසර තුළ ඇමතිවරු ලෙස සිටිමින් රාජපක්ෂ පවුලට ගැතිකම් කළා මිස රටේ යහපතට කළ දෙයක් නැත. ඔවුන් දක්ෂ ඇමතිවරුන්බව ඔප්පු කර ඇත්ද? ජනාධිපතිවරණයෙන් පසුව ගත වූ හය මාසය තුළ ඔවුන් කළේ ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර භේද ඇති කිරීමට හැකි තරම් උත්සාහ කිරීමයි. දැන් ඇමතිකම් ලබා ගෙන ඔවුන් එයම නොකරාවිය යන්නට ඇත්තේ කුමන සහතිකයක්ද?

සුසිල් ප්‍රේමජයන්ත මහතා දැන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහලේකම් තනතුරෙන් ඉවත් වී තිබේ. ඔහු රටේ යහපත වෙනුවෙන් ක්‍රියා කරන දේශපාලනඥයකු නම් එය කළ යුතුව තිබුණේ නාමයෝජනා සකස් කිරීමේ අවස්ථාවේදීය. මහින්ද රාජපක්ෂගේ උවමනාවට සියලු දූෂිතයන්, අපරාධකාරයන් නාමයෝජනා ලැයිස්තුවට ඇතුළත් කළේ ඔහුය. ඒ අනුව දූෂිතයන් ගණනාවකට යළි පාර්ලිමේන්තුවට එන්නට පාර හද දුන්නේ ඔහුය. දැන් ඔහුට කුණුහරුපයෙන් පවා බණිනවා කියන්නේ ඒ අයම නොවේද?

12 වන පිටට